# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2377/17 - 2024 මාර්තු මස 26 වැනි අඟහරුවාදා - 2024.03.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි සහ 5 වැනි වගන්ති යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි උපලේඛනයේ (I) වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන්, එම උපලේඛනයේ II තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතාංකය* | *විස්තරය* | |
| 1. | 07.03 | 0703.10.30 | අනෙකුත් ළූනු | කි.ග්‍රෑමයකට රු. 10 |

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ වූ මෙම නියමය, එකී පනතේ 2 වැනි වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව 2024 මාර්තු මස 27 දිනෙන් ආරම්භ වී 2024 අප්‍රේල් මස 30 වැනි දින දක්වා වලංගු වේ.

2. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1006.30.29 යටතේ වර්ගීකරණය වන සහල් ආනයනය කිරීමේ දී 2023 මැයි 17 දිනැති අංක 2332/14 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් පනවා ඇති කිලෝ ග්‍රෑමයක් සඳහා රු. 65 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කිලෝ ග්‍රෑමයක් සඳහා රු.1 ක් අයකර ගෙන ඉතිරි වටිනාකම අත්හරිනු ලැබීම සඳහා මෙයින් නියමයක් පනවමි.


1A - PG 6682 — 429 (2024/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම විශේෂ වෙළඳ භාණ්ඩ බදු අත්හැරීම වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වෙතින් 2024 ජනවාරි 21 වැනි දිනට පෙර ආනයන පාලන බලපත්‍රයක් ලබාගෙන ඇති ඕනෑම සහල් ආනයනකරුවෙකු සඳහා අදාළ වන අතර, 2024 ජනවාරි 02 සිට 2024 ජනවාරි 21 දක්වා කාල සීමාවට අදාළ වන දිනයක් සහිත නෞභාර පත්‍රයක් (BL) හෝ ගුවන්භාර පත්‍රයක් (AWB) සහිතව එම සහල් ප්‍රමාණයන් ආනයනය කිරීම සිදුකර තිබිය යුතු ය.

2017 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වන වගන්තිය යටතේ වූ මෙම නියමය, එකී පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව 2024 මාර්තු මස 27 දින සිට ආරම්භ වී 2024 අප්‍රේල් මස 03 වැනි දින දක්වා වලංගු වේ.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 මාර්තු මස 25 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 03 - 0222

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.